# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2011 අංක 6 දරන රෝහිත අබේගුණවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2011 පෙබරවාරි මස 23 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2011 පෙබරවාරි මස 25 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 6.00 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

## 2011 අංක 6 දරන රෝහිත අබේගුණවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2011 පෙබරවාරි මස 23 වන දින]

එල්. ඩී.— ඕ. (අයි.එන්.සී.) 15/2009.

**රෝහිත අබේගුණවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"රෝහිත අබේගුණවර්ධන පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව, එකී සංගමයට සම්බන්ධ සියලු පරමාර්ථ සහ ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා එකී සංගමය විසින් මෙතෙක් කල් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් ද, එකී සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2011 අංක 6 දරන රෝහිත අබේගුණවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "පදනම") යනුවෙන් සඳහන් කරනු ලබන "රෝහිත අබේගුණවර්ධන පදනමේ" දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් හා මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් හඳුන්වනු ලබන) "රෝහිත අබේගුණවර්ධන පදනම" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් හා සංස්ථාව විසින් ඊට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරිය එයට ඇත්තේ ය. රෝහිත අබේගුණවර්ධන පදනම සංස්ථාගත කිරීම.

3. (1) සංස්ථාව පිහිටුවීමට හේතු වූ පොදු පරමාර්ථ පහත දැක්වෙන ඒවා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) පොදු ජනතාවගේ සහ විශේෂයෙන් කළුතර දිස්ත්‍රික්කයේ ජනතාවගේ, සහභාගිත්වය තුළින් සමාජ සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම ;

(ආ) රටේ සාමාජීය, සංස්කෘතික හා ආර්ථික සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම්වලට සහභාගී වීම ;

(ඇ) ආගම, පරිසරය සහ වෙනත් සාරධර්ම පිළිබඳව දැනුවත් වීමට ළමයින් පුහුණු කිරීම සහ රටේ සංවර්ධනය උදෙසා සහභාගි වීමට සහ හොඳින් හැදීවැඩීමට ඔවුන් තුළ හැකියාව වැඩිදියුණු කිරීමේ අදහසින් ක්‍රීඩා කටයුතු පිළිබඳ උනන්දුවක් ඔවුන් තුළ ඇති කිරීම ;

(ඈ) ආගමික මධ්‍යස්ථාන පිහිටුවීමෙහි ලා සහ සංවර්ධනය කිරීමෙහි ලා ආධාර ලබා දීම ;

(ඉ) ජනතාවගේ සදාචාරාත්මක හා සංස්කෘතික අගයන් සුරැකීමට හා ආරක්ෂා කිරීමට පියවර ගැනීම ;

(ඊ) මහජනතාව හා රාජ්‍ය සේවය අතර ඇති පරතරය ඉවත් කිරීම උදෙසා කටයුතු කිරීම ;

(උ) දිළිඳු තැනැත්තන්ට නීති ආධාර සහ නීති උපදෙස් ලබා ගැනීම සඳහා සහාය වීම ;

(ඌ) හදිසි ආපදාවල වින්දිතයන්ට සහාය දීම සහ ඔවුන්ට තම ජීවන තත්ත්වය නගාසිටුවා ගැනීම සඳහා ආධාර දීම ;

(එ) මානසික හා ශාරීරික දුබලතාවලින් පීඩා විඳින්නන්ට ආධාර ලබා දීම ; සහ

(ඒ) කාන්තාවන්ගේ සහ ළමුන්ගේ අයිතීන් ප්‍රවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියා කිරීම.

(2) මේ පනතේ (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ දී ජාතිය, කුලය, ආගම භාෂාව, ස්ත්‍රී පුරුෂ භේදය හෝ, දේශපාලන මතය යන කරුණු සම්බන්ධයෙන් කිසිදු වෙනස්කම් කිරීමකින් තොරව කටයුතු කිරීමට සංස්ථාව විසින් සහතික කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත සඳහන් බලතල ද ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් වැඩිදියුණු කිරීම උදෙසා අවශ්‍ය හෝ යෝග්‍ය කවර හෝ සියලු ක්‍රියා, කාරණා සහ කිරීමට, ඉටු කිරීමට හා ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය.

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීමට, අත්කර ගැනීමට, කුලියට ගැනීමට, ඉදි කිරීමට හෝ අන්‍යාකාරයෙන් ලබා ගැනීමට ;

(ආ) මුදලින් හෝ වෙනත් ආකාරයකින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ඉල්ලා සිටීමට, ලබාගැනීමට සහ එක්රැස් කිරීමට ;

(ඇ) බැංකු ගිණුම් විවෘත කිරීමට, පවත්වාගෙන යාමට සහ වැසීමට ;

(ඈ) ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමට හෝ ලබා ගැනීමට ;

(ඉ) සංස්ථාවේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් සංස්ථාව විසින් සුදුසු යයි සලකනු ලබන ආකාරයකින් ආයෝජනය කිරීමට.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ කටයුතු, මේ පනතේ විධිවිධානවලට ද, 6 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට ද යටත්ව සභාපතිවරයකු, උපසභාපතිවරුන් දෙදෙනකු, ලේකම්වරයකු, භාණ්ඩාගාරික සහ සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරාපත් කරනු ලබන අනෙකුත් සාමාජිකයන් දස දෙනකුගෙන් ද සමන්විත (මෙහි මින් මතු "සභාව" යනුවෙන් හඳුන්වනු ලබන) විධායක සභාවක් මගින් පරිපාලනය කළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ ධුර දැරූ, සභාවේ සාමාජිකයන්ගෙන් සංස්ථාවේ ප්‍රථම විධායක සභාව සමන්විත විය යුතු ය. සංස්ථාවේ රීතිවලට අනුකූලව සභාවක් තෝරාපත් කරගන්නා තෙක් එකී සභාව ධුර දැරිය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, ගෙවනු ලැබිය යුතු සාමාජික ගාස්තු, සාමාජිකයන් ඇතුළත් කරගැනීම, සාමාජිකත්වයෙන්, අස් කිරීම, පහකිරීම හෝ සාමාජිකයන්ගේ ඉල්ලා අස්වීම ;

(ආ) සභාවට සාමාජිකයන් තෝරාපත් කර ගැනීම සහ ඔවුන්ගේ බලතල සහ කාර්ය ;

(ඇ) ධුර දරන්නන් තෝරාපත් කර ගැනීම, ඔවුන්ගේ ධුර කාලය, ධුරයෙන් ඉල්ලා අස්වීම, ධුරය හිස්කිරීම හෝ ධුරයෙන් පහකිරීම සහ ඔවුන්ගේ බලතල, චර්යාව සහ කාර්ය ;

(ඈ) සංස්ථාවේ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ හා සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය ;

(ඉ) සභාවේ රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, රැස්වීම් පවත්වන වේලාවන්, ස්ථාන, රැස්වීම් පිළිබඳ නිවේදන හා න්‍යායපත්‍ර, රැස්වීම්වල ගණපූරණය සහ ඒ රැස්වීම්වල කටයුතු පවත්වනු ලබන ආකාරය ;

(ඊ) අරමුදල් ද ඇතුළුව සංස්ථාවේ දේපළ පරිපාලනය හා කළමනාකරණය කිරීම ; සහ

(උ) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම හා එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදන ලද රීති (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනි රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් මේ වගන්තිය යටතේ සාදනු ලැබූ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

7. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, රික්තවරණ, තෙස්තමේන්තු නීයාදන, ප්‍රදාන, පරිත්‍යාග, ගාස්තු සහ දායක මුදල් වශයෙන් සාමාජිකයන්ගෙන් ද සාමාජිකයන් නොවන්නන්ගෙන් ද දේශීය හෝ විදේශීය ආයතනවලින් හා තැනැත්තන්ගෙන් ද ලැබෙන මුදල්වලින් එය සමන්විත විය යුතු ය.

(2) සංස්ථාවට ලැබෙන සියලු මුදල් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි, සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා සුදුසු ආකාරයෙන් බැංකු එකක හෝ වැඩි ගණනක තැන්පත් කළ යුතු ය.

(3) සංස්ථාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා සංස්ථාව විසින් දරනු ලබන සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවිය යුතු ය.

8. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති පදනමේ සියලුම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතුව තිබුණු සියලුම ණය සහ පදනමට ගෙවනු ලැබිය යුතු සම්මාදම් මුදල් හා දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය. පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය.

9. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, තෙස්තමේන්තු නීයාදනයක් මගින් හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් සංස්ථාවේ රීතිවලට යටත්ව ලබා ගැනීමට හා දැරීමට නීතියෙහි ලා සංස්ථාවට හැකියාව ඇති අතර, ඒ දේපළ විකිණීමට, උකස් කිරීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා 6 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව, සංස්ථාව විසින් ඒ සියලුම දේපළ දැරිය යුතු ය. සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

10. සංස්ථාවේ කිසිම සාමාජිකයකු විසින් සංස්ථාවේ ණය සහ වගකීම්, ඉටු කිරීමේ කාර්යයක් සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා සංස්ථාව වෙත කලින් කල ගෙවිය යුතු සාමාජික ගාස්තු මුදල් ඉක්මවනු ලබන්නා වූ යම් දායක මුදලක් ගෙවීම සඳහා යටත් නොවිය යුතු ය. සාමාජිකයන්ගේ වගකීම සීමා සහිත වීම.

සංස්ථාව විසුරුවා හැරීමෙන් පසු ඉතිරිවන දේපළ.

11. සංස්ථාව විසුරුවා හැරීමේ දී සංස්ථාවේ සියලුම ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර වුවද දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා නොදිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය ආදායම හෝ දේපළ කිසිවක් තම සාමාජිකයන් අතර බෙදා දීම එහි රීති මගින් තහනම් කරනු ලැබ ඇත්තා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කළ යුතු ය.

ගිණුම් සහ විගණනය.

12. (1) සංස්ථාව විසින් එහි ආදායම් හා වියදම්, වත්කම් හා බැරකම් හා සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබාගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සභාව විසින් පත්කරනු ලැබිය යුතු සුදුසුකම් ලත් විගණකවරයකු හෝ විගණකවරුන්ගේ ආයතනයක් විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක, එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

13. සභාපතිවරයා හෝ එක් උපසභාපතිවරයකු හා ලේකම්වරයා හෝ ඉදිරිපිට හැර සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් විසින් තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව.

14. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය. ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

15. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.